# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2292/17 - 2022 අගෝස්තු මස 09 වැනි අඟහරුවාදා - 2022.08.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

ශුද්ධිපත්‍රයයි

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

යොමු අංකය: PUT/LND/01/01/17.
4-3/9/2015/WS/210.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 07 වන වගන්තිය යටතේ පහත විස්තර කරන ඉඩමට අදාලව 2021 මැයි මස 04 වැනි දින මවිසින් අංක 2226/27 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* III වැනි කොටසේ ඉඩම් යටතේ පළ කරන ලද දැන්වීම සංශෝධනය කර පහත දැක්වෙන පරිදි පළකරනු ලැබේ.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තරය:*

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පුත්තලම පත්තුව සුළු කොට්ඨාසයේ අංක 616 සේනකුඩිරිප්පුව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, සේනකුඩිරිප්පුව ගමේ පුත්තලම කොට්ඨාස අංක 3 - (පුත්තලම නගර සීමාව තුළ) ගමේ පිහිටි පුත්තලම මිනුම් අධිකාරි විසින් පිළියෙල කරන ලද මු.පි.පු.ක.සි. 410112 හා 2020.02.12 දිනැති මූලික පිඹුරේ පහත සඳහන් ඉඩම් කොටස:

01. **කැබලි අංක 124**

ඉඩමේ නම: මුඩලිය සෙනායි වත්ත; විස්තරය: වත්ත, පොල් වගාවක් ඇත; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: අයි. එන්. එම්. මොහොමඩ් කාසිම් මරික්කාර්; ප්‍රමාණය: හෙක්ටයාර් 1.2197.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022 ඔක්තෝබර් මස 10 වැනි දින පෙ.ව. 10.00ට පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තව ද, 2022 සැප්තැම්බර් මස 26 දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය.

**එස්. ඒ. වයි. ආර්. ජයතිලක,**
ප්‍රාදේශීය ලේකම්,
පුත්තලම.

2022 අගෝස්තු මස 03 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
පුත්තලම.

EOG 08 - 0067



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*